# 7 ශ්‍රේණිය සිංහල -2022

## 06 ඒකකය

# මේ කාගේ දෝ කමතා



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

07 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍ර 02ක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 05. මේ කාගේ දෝ කමතා



ජනතාව අතර ම නිර්මාණය වී පැවත එන ජන කවි සම්ප්‍රදායයක් අප රටේ ද දක්නට ලැබේ. ස්වකීය අත්දැකීම් රසවත් ප්‍රකාශන ලෙස සමාජයට දායාද කිරීමට ගැමි ජනයා සතු වූ කුසලතාව ජන කවියෙන් ප්‍රකට වේ.

පාදක වූ අවස්ථා අනුව ජන කවි කමත් කවි, පැල් කවි, පාරු කවි ආදි වශයෙන් වර්ගීකරණයට ලක් කරනු දැකිය හැකි ය. මෙම පාඩමට ඇතුළත් වන්නේ කමත් කවි කිහිපයකි. ගොයම් කපා කොළ මැඩීමේ දී ගොවියෝ මෙබඳු කවි ගායනය කරති.

## අරුත් පැහැදිලි කිරීම

- ✓ කමත - ගොයම් පාගන භූමිය/ස්ථානය/කලවිට
- ✓ කොළ බඳිතා - කමත් බිමේ මැද කොළ වර්ග තැන්පත් කිරීම
- ✓ බිම් බඳිතා - කොළ මැඩීම සඳහා බිම සැකසීම, කිරි සහිත කොළ වර්ග හා උපකරණ වටේට තබා බිම සකස් කෙරේ
- ✓ කොළ මැඩීම - ගොයම් පෑගීම
- ✓ කෑලිය කොළ - පඳුරු වශයෙන් වැවෙන කිරි සහිත පැළෑටියකි; නාග බැවිල/කොහු කිරිල්ල/ගස් කෑලිය
- ✓ මදු කොළ - හරකුන් කෑමට ප්‍රිය කරන ගිරිතිල්ල කුලයේ වැල් විශේෂයක්. මේවා හරකුන්ට කෑම සඳහා කමතෙහි තබනු ලැබේ.
- ✓ අටු - කොටු - බැත (වී) තැන්පත් කර ඇති ස්ථානය

# ජන කවි හඳුනා ගැනීම

- ✓ ජනතාව අතරේ ම ඇති වී ජනතාව අතරේ ම ආරක්ෂා වී පැවත එන කවි, ජන කවි නමින් හැඳින්වේ.
- ✓ කාලයෙන් කාලයට භාෂාව වෙනස් වීමත්, මිනිසුන් අතර මතකයෙන් භාවිත වන නිසාත් ජන කවිය ද කාලයෙන් කාලයට වෙනස් වේ.
- ✓ ජන කවිවල කතුවරයා හඳුනා ගත නො හැකි ය.
- ✓ ජන කවියට වස්තු විෂය වී ඇත්තේ මිනිසුන්ගේ එදිනෙදා අත්දැකීම්, ඇදහිලි විශ්වාස, ජීවනෝපාය, ක්‍රීඩා හා විනෝදාස්වාද මාර්ග, හැඟීම් වැනි තේමා ය.
- ✓ සිංහල ජන කවිවල සුවිශේෂ ගුණාංග රැසකි.
  1. අව්‍යාජත්වය
  2. සරලත්වය
  3. සංක්ෂිප්තභාවය
  4. අලුත් උපමා රූපක භාවිතය
  5. හැඟීම් ප්‍රකාශනයේ දී දැක්වූ සංයමය
  6. සාමූහික රටාවෙන් යුක්ත වීම (නන්දසේන රත්නපාල, ජනශ්‍රැති විද්‍යාව)

**අවබෝධය**

1. කමතට දේවාශීර්වාදය ලබා ගැනීමට උත්සාහ කර ඇති බවට උදාහරණ දෙකක් දෙන්න.
2. කොළ මැඩීමේ දී ගොනා වැදගත් බව ප්‍රකාශ වන කවිය ලියන්න.
3. "බැත උඩ සිට මුහුද දුටිමි" යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?
4. කොළ මැඩීම මහත් ආශීර්වාදයක් බව පැවසෙන්නේ කුමන කවියෙන් ද?
5. කමත පුරවන්න යැයි කියන්නේ කුමන බැතවලින් ද?

- **අවබෝධය**

1.
- ✓ කමත ඉරු දෙවියන්ගේ බවත්, සඳ දෙවියන්ගේ බවත් ප්‍රකාශ කිරීම.
- ✓ කමත සැම දෙවියන්ගේ බවත්, ඔවුන් බිම් බඳින බවත් බිම් බැඳි තැන කොළ බඳින බවත් ප්‍රකාශ කිරීම.

2. කෑලිය කොළ බැන්ද   මටා
මදු කොළ බැන්දේ   කුමටා
ඒ මට කළ හොඳ   කමටා
කොළ මැඩවා දෙන්   සොඳටා

3. බැත උඩ සිට ඈත මුහුද පෙනෙන තරමට ඉතා සරුසාර අස්වැන්නක් ලැබී ඇති බව.

4. බුදුන් වඩින   වේලාවයි
කිරි උතුරන   වේලාවයි
කොළ මඩවන   වේලාවයි
කමත පිරෙන   වේලාවයි

5. අටු කොටුවල තියෙන බැත, ඉහළ පහළ තියෙන බැත, ලබු ගෙඩිවල තියෙන බැත

# විරුද්ධාර්ථ පද

- කිසි යම් පදයකින් ඉදිරිපත් කෙරෙන අර්ථයට, විරුද්ධ වූ අර්ථයක් වෙනත් පදයකින් ගෙන හැර දක්වන්නේ නම් එය විරුද්ධාර්ථ පදයකි. උදා: ඈත - මෑත, දුක - සැප, හොඳ - නරක

- සිංහල භාෂාවේ විරුද්ධාර්ථ පද කිහිප ආකාරයකට සෑදේ.
  1 නාම පදයකට හෝ ක්‍රියා පදයකට හෝ මුලින් උපසර්ගයක් යෙදීමෙන් උදා :
    - ✓ නම්බුව - අවනම්බුව.
    - ✓ පිරිසිදු - අපිරිසිදු
    - ✓ භය - නිර්භය

  2 නාම පදයකට හෝ ක්‍රියා පදයකට හෝ මුලින් නිපාත පදයක් යෙදීමෙන් උදා :
    - ✓ වෙනස් - නො වෙනසත්
    - ✓ හොඳ - නොහොඳ
    - ✓

  3 වෙනත් පදයක් භාවිත කිරීමෙන් උදා :
    - ✓ ඇති - නැති
    - ✓ යන - එන
    - ✓ අඳුර - එළිය

**ලිඛිත අභ්‍යාස**

1. පහත සඳහන් පදවලට සුදුසු විරුද්ධාර්ථ පද පාඩමෙන් සොයා ලියන්න.

   i. ඉහළ -
   ii. නොගෙනා -
   iii. නරක -
   iv. අවේලාව -
   v. යට -

2. වරහනට පිටතින් දී ඇති පදයට සුදුසු විරුද්ධාර්ථ පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

   i. අවමාන (අසමාන, විමාන, සම්මාන)
   ii. අන්ත (අන්තර, සමාන්තර, අනන්ත)
   iii. අභ්‍යන්තර (නිරන්තර, බාහිර, අන්තර)
   iv. මෛත්‍රී (කරුණා, ක්‍රෝධ, වෛරී)
   v. යහගුණ (අවගුණ, අගුණ, දෙගුණ)

- ## ලිඛිත අභ්‍යාස

**1.**

I. ඉහළ - පහළ
II. නො ගෙනා - ගෙනා
III. නරක - සොඳ
IV. අවේලාව - වේලාව
V. යට - උඩ

**2.**

I. අවමාන (අසමාන, විමාන, සම්මාන)
II. අන්ත (අන්තර, සමාන්තර, අනන්ත)
III. අභ්‍යන්තර (නිරන්තර, බාහිර, අන්තර)
IV. මෛත්‍රී (කරුණා, ක්‍රෝධ, වෛරී)
V. යහගුණ (අවගුණ, අගුණ, දෙගුණ)
VI. උත්තම (උසස්, අධම, පහත්)
VII. ජාතික (විජාතික, අවජාතික, සහජාතික)

vi. උත්තම (උසස්, අධම, පහත්)
vii. ජාතික (විජාතික, අවජාතික, සහජාතික)

3. තද කළු අකුරින් යෙදී ඇති පදයට සුදුසු විරුද්ධාර්ථ පදය හිස්තැනට යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. ගොවීහු ........................ කාලයේ ගොයම් කපා රාත්‍රී කාලයේ කොළ මැඩීම කරති.
ii. කමතේ දී ගොනුන්ට අමතන්නේ ........................... නො ව ආදරයෙනි.
iii. පොළව ........................... වුවත් පොහොර යොදා සරු අස්වැන්නක් ලබා ගත හැකි ය.
iv. සමහර ගොවීහු මිනිසුන් ........................... කළත් දෙවියන් කෙරෙහි විශ්වාසය තබා කටයුතු කරති.
v. කොළ මැඩීමේ කටයුතු සාර්ථකව කළ හැක්කේ කම්මැළි මිනිසුන්ට නො ව ........................... අයට ය.

**3.**

I. ගොවීහු **උදෑසන** කාලයේ ගොයම් කපා රාත්‍රී කාලයේ කොළ මැඩීම කරති.
II. කමතේ දී ගොනුන්ට අමතන්නේ **අනාදරයෙන්** නො ව ආදරයෙනි.
III. පොළව **නිසරු** වුවත් පොහොර යොදා සරුඅස්වැන්නක් ලබා ගත හැකි ය.
IV. සමහර ගොවීහු මිනිසුන් **අවිශ්වාස** කළත් දෙවියන් කෙරෙහි විශ්වාසය තබා කටයුතු කරති.
V. කොළ මැඩීමේ කටයුතු සාර්ථකව කළ හැක්කේ කම්මැළි මිනිසුන්ට නො ව **කඩිසර** අයට ය.

## ප්‍රායෝගික අභ්‍යාස (Home Work)

### ප්‍රායෝගික අභ්‍යාස

1. කවි පෙළ තාලානුකූලව ගායනා කරන්න.
2. කෘෂිකාර්මික ජීවිතයට සම්බන්ධ ජන කවි එක් රැස් කර පොත් පිංචක් සකස් කරන්න.
3. කමත් භාෂාවට අයත් වචන දහයක් සොයා ලියන්න.

## කමත් භාෂාව

- ✓ අළුහන් වැඩීම - කමතේ අළුවලින් යන්ත්‍රයක් ඇඳීම
- ✓ උප්පිඩි - දෑතින් අල්ලා ගත හැකි තරම් වූ ගොයම් ප්‍රමාණය
- ✓ බාන - ගොන් දෙන්නකු යෙදූ කැරැල්ල
- ✓ කුල්ල - යතුර
- ✓ මාගල - පයින් ගොයම් පාගන විට එළන පැදුර
- ✓ කූටාලම - වී මැනීමට භාවිත කළ උපකරණයකි.
- ✓ දෙබර අත්ත - කාටුව බේරීමට භාවිත කරන උපකරණයකි.
- ✓ මුදුනා - ඇඳුත්තේ නායකයා
- ✓ හරක් කැරැල්ල/ඇඳුත්ත - කොළ මැඩීමට හරකුන් එකට ඇඳා ගැනීම
- ✓ කොළමුත්තා, එළවිස්සා, මට්ටයා, කලාතයා - ඇඳුත්තේ සෙසු හරක් සිවුදෙනා

## ගොයම් කවි, නෙළුම් කවි හා පැල් කවි

ගිමන් හැර ගොසින් නැමිලා නෙළන කොට
මුවෙන් සිනා සී වටපිට බලන කොට
සවන් නමා රසකර කවි අසන්නට
පටන් ගන්න කවි සීපද කියන්නට

කනට මිහිරි රසවත් කවි කියමින්
වෙහෙස මහන්සිය දුරු කර ගනිමින්
පස්සෙන් පස්සට පියවර නඟමින්
සුන්දර තාලෙට නෙළමුව විගසින්



අලංකාර කෙත සැදුවේ රජවර
සයංජාත රත් හැල් ගෙන ගොඩ කර
සුදම් දිව්ය පුරයක් වැනි හැම වර
ගොයම් සැදුණ හැටි අසනු ය විස්තර

ඇසී නාද හඬ බඹරුගෙ ලීලා
පැසී ගොයම් පත් කිරට නැමීලා
ගැසී සුළං වාතෙට ඉතී නැමීලා
පැසී ගොයම් කෙත සුරපුර ලීලා

පෙර කලේ තැනූ පැල දැන් දිරාලා
එම කලේ බැඳපු වැට ගොනු කඩාලා
පැල්පතේ ගොයම් රෑ රැක බලාලා
නිදිමතේ කියම් පැල් කවි ගොතාලා

යහපත් මිතුර ඉන්නා ඔය ඉහළ පැලේ
කොහොමත් බැරිය නවතන්නට ඌරු රැළේ
කියතොත් තදට උන් බිය වී දුවති කැලේ
කියතොත් තරගෙට ම සිවුපද කියමු පැලේ



නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10
## ඒකක පරීක්ෂණය - 2020
## සිංහල භාෂාව
## 7 ශ්‍රේණිය

**(6) ඒකකය**

## <u>මේ කාගේ දෝ කමතා</u>

- **පෙළ පොතේ නියමිත පාඩම ඇසුරෙන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01.(i) පාඩමේ යෙදෙන ජනකවි වර්ග නම් කරන්න.

……………………………………………………………………………………..

(ii) ජන කවි වල දක්නට ලැබෙන සුවිශේෂී ගුණාංග මොනවා ද?

……………………………………………………………………………………..

(iii) කමත් කවි තුළින් දක්නට ලැබෙන ගොවියාගේ යහගුණ මොනවාද ?

……………………………………………………………………………………..

(iv) මෙම පාඩමේ ජන කවි සාමූහික නිර්මාණයක් බව පවසා ඇත්තේ කවරෙක් ද ?

……………………………………………………………………………………..

(v) ඒ බව සඳහන් වන ග්‍රන්ථය කුමක් ද ?

……………………………………………………………………………………..

(vi) ජන කවියා ස්වභාව ධර්මය දේවත්වයෙන් සැලකූ බව හැඟවෙන කවි පද දෙක බැගින් උපුටා ලියන්න.

……………………………………………………………………………………..

(vii) වී අස්වැන්න සරුබව මෙහි ජන කවියා ප්‍රකාශ කොට ඇත්තේ කෙසේ ද ? ඊට අදාළ කවි පදය උපුටා දක්වන්න.

……………………………………………………………………………………..

(2) පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) ගොයම් පැගීමේදී ගොවියෝ …………………… ගායනා කරති.
(ii) ජනකවි …………………… නිර්මාණයකි.
(iii) …………………… යන නමින් ද කමත හැඳින්වෙයි.
(iv) නව උපමා රූපක භාවිතයෙන් ජන කවියාගේ කාව්‍ය …………………… ප්‍රකට වේ.
(v) ජනකවි ජනතාව අතර …………………… පහළ වූවකි.

( ප්‍රතිභාව / නිරායාසයෙන් / සාමූහික / කල විට / කමත් කවි )

(3) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ දෙන පද ත්‍රිකෝණය තුළින් තෝරා හිස්තැන්වලට යොදන්න.

(i) ප්‍රකට ........................
(ii) ගරු ........................
(iii) නිරායාසයෙන් ........................
(iv) සමීප ........................
(v) වෙනස් ........................
(vi) බහුල ........................
(vii) පොදු ........................
(viii) නිතර ........................
(ix) කාරුණික ........................
(x) කීර්තිය ........................

දුර
විරල
ඉඳහිට
පෞද්ගලික
අප්‍රකට
අපකීර්තිය , අගරු
නොවෙනස්
ආයාසයෙන් ,
සංකීර්ණත්වය
අකාරුණික

## ගුරු ඇස් පොතෙන්...

- පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද පාඩමෙන් සොයා ලියන්න.

ඉර, ඉහළ, දුටු, යට, නරක
අවේලාව, කළ

- පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද ලියන්න.

ළඟ -
ඇත -
උත්තම -
එනවා -
උඩ -

- විරුද්ධාර්ථය දෙන පදය කොටුවෙන් සොයා ලියන්න.

ප්‍රශ්නය -
කඩිසර -
අග -
පැහැදිලි -
ආවරණය -

| |
|---|
| අපැහැදිලි |
| පිළිතුර |
| කම්මැලි |
| අනාවරණය |
| මුල |

- යටින් ඉරි ඇඳි පදවලට විරුද්ධාර්ථ පද තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

1. උදේ පිපුණු මල සවසට ........................
2. දුක්ෂ මෙන් ම ..................... ළමයි ද පන්තියේ සිටිති.
3. පොළව නිසරු වුව ද පොහොර යොදා ........................ අස්වැන්නක් ලබා ගත හැකි ය.
4. රෝගී වූ අය .................... කිරීමට ඖෂධ ලබා දෙයි.
5. ඉහළට පැද ගිය ඔරුව සැඩ පහර නිසා .................... ඇදී ගියේ ය.

# පිළිතුරු



**Answer**

නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda

නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණය - 2020

සිංහල භාෂාව

7 ශ්‍රේණිය

කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10

**1.**

I. කමත් කවි.

II. අව්‍යාජත්වය, සරලත්වය, සංක්ෂිප්තභාවය, අලුත් උපමා රූපක භාවිතය හා හැඟීම් ප්‍රකාශනයේ දී දැක්වූ සංයමය ආදිය.

III. සාමූහික බව, ස්වභාව ධර්මය දෙවියන් සේ ඇදහීම, ස්වභාව ධර්මයට මෙන් ම කොළ මැඩීමට දායක වන ගවයන්ට ද කෘත ගුණ දැක්වීම

IV. නන්දසේන රත්නපාල මහතා

V. ජනශ්‍රැති විද්‍යාව

VI. මේ කාගේ මේ කමතා - ඉරු දෙවියන්ගේ කමතා.
මේ කාගේ දෝ කමතා - සඳු දෙවියන්ගේ කමතා.
මේ කාගේ මේ කමතා - සැම දෙවියන්ගේ කමතා

VII. වී ගොඩ මතට නැගි විට ඈත මුහුද පෙනෙන බව ප්‍රකාශ කිරීමෙන්, වී අස්වැන්නේ සරුබව ප්‍රකට වෙයි.
- ✓ 'බැත උඩ සිට මුහුද දුටිමි'

**2.**

I. ගොයම් පෑගීමේදී ගොවියෝ කමත් කවි ගායනා කරති.

II. ජනකවි සාමුහික නිර්මාණයකි.

III. කලවිට යන නමින් ද කමත හැඳින්වෙයි.

IV. නව උපමා රූපන භාවිතයෙන් ජන කවියාගේ කාව්‍ය ප්‍රතිභාව ප්‍රකට වේ.

V. ජනකවි ජනතාව අතර නිරායාසයෙන් පහළ වූවකි.

**3.**

I. අප්‍රකට

II. අගරු

III. ආයාසයෙන්

IV. දුර

V. නොවෙනස්

VI. විරල
VII. පෞද්ගලික
VIII. ඉඳහිට
IX. අකාරුණික
X. අපකීර්තිය

4.

I. සඳ
II. නැත
III. නුදුටු
IV. උඩ
V. හොඳ
VI. වේලාව
VII. නොකළ



5.

I. දුර
II. මෑත
III. අධම
IV. යනවා
V. යට

6.

I. පිළිතුර
II. කම්මැළි
III. මුල
IV. අපැහැදිලි
V. අනාවරණය

7.

I. උදේ පිපුණු මල සවසට පරවෙයි.
II. දක්ෂ මෙන් ම අදක්ෂ ළමයි ද පන්තියේ සිටිති.
III. පොළව නිසරු වුව ද පොහොර යොදා සරු අස්වැන්නක් ලබා ගත හැකි ය.
IV. රෝගී වූ අය නීරෝගී කිරීමට ඖෂධ ලබා දෙයි.
V. ඉහළට පැද ගිය ඔරුව සැඩ පහර නිසා පහළට ඇදී ගියේ ය.

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුළු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

**ස්තූතියි !**

**හසිත හෙට්ටිආරච්චි**
**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ